# මහා පුරිස සුත්තං

*(මහා පුරුෂයා ගැන වදාළ දෙසුම)*

මා හට අසන්නට ලැබුනේ මේ විදියට යි. ඒ දවස්වල භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ සැවැත්නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයේ යි. එදා සාරිපුත්ත මහරහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියා. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත් පසෙකින් හිඳ ගත්තා. එකත් පසෙකින් හිඳ ගත් සාරිපුත්ත මහරහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසුවා.

"ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, 'මහා පුරුෂයා, මහා පුරුෂයා' කියා කියනවා. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මහා පුරුෂයෙකු වන්නේ කොපමණ කරුණු වලින් ද?"

"පින්වත් සාරිපුත්ත, විමුක්ත *(අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් නිදහස් වී ගිය)* සිතකින් යුතු තැනැත්තා මම මහා පුරුෂයෙක් යැ යි කියමි. විමුක්ත නො වූ සිතක් ඇති තැනැත්තා මම මහා පුරුෂයෙක් ලෙස නො කියමි. පින්වත් සාරිපුත්ත, විමුක්ත සිතකින් යුතු වන්නේ කෙසේ ද?

පින්වත් සාරිපුත්ත මේ ශාසනයේ භික්ෂුවක් කෙළෙස් තවන වීරියෙන් යුතු ව, මනා නුවණකින් යුතුව, මනා සිහියකින් යුතු ව, *(කය නම් වූ)* ලෝකය කෙරෙහි ඇති දැඩි ලෝභය හා මානසික දුක දුරුකරමින්, කය කෙරෙහි කයෙහි යථා ස්වභාවය අනුව බලමින්, වාසය කරයි *(කායානුපස්සනාව)*. මේ අයුරින් කයෙහි කය අනුව බලමින් වාසය කරන ඔහු ගේ සිත කිසිවකට නො ඇලේ. ලෝකයෙහි කිසිවක් අල්ලා නො ගෙන සිත කෙළෙසුන් ගෙන් මිදෙයි.

එසේ ම, කෙළෙස් තවන වීරියෙන් යුතු ව, මනා නුවණකින් යුතු ව, මනා සිහියකින් යුතු ව, ලෝකය කෙරෙහි ඇති දැඩි ලෝභය හා මානසික දුක දුරුකරමින්, වේදනාවන් කෙරෙහි වේදනාවන් ගේ යථාස්වභාවය අනුව බලමින් වාසය කරයි *(වේදනානුපස්සනාව)*. මේ අයුරින් වේදනාවන් කෙරෙහි වේදනාවන් ගේ යථා ස්වභාවය අනුව බලමින් වාසය කරන ඔහු ගේ සිත කිසිවකට නො ඇලේ. ලෝකයෙහි කිසිවක් අල්ලා නො ගෙන සිත කෙළෙසුන් ගෙන් මිදෙයි.

එසේ ම, කෙළෙස් තවන වීරියෙන් යුතු ව, මනා නුවණකින් යුතු ව, මනා සිහියකින් යුතු ව, ලෝකය කෙරෙහි ඇති දැඩි ලෝභය හා මානසික දුක දුරුකරමින්, සිත කෙරෙහි සිතේ යථාස්වභාවය අනුව බලමින් වාසය කරයි *(චිත්තානුපස්සනාව)*. මේ අයුරින් සිත කෙරෙහි සිතේ යථා ස්වභාවය අනුව බලමින් වාසය කරන ඔහු ගේ සිත කිසිවකට නො ඇලේ. ලෝකයේ කිසිවක් අල්ලා නො ගෙන සිත කෙළෙසුන් ගෙන් මිදෙයි.

එසේ ම, කෙළෙස් තවන වීරියෙන් යුතු ව, මනා නුවණකින් යුතු ව, මනා සිහියකින් යුතු ව, ලෝකය කෙරෙහි ඇති දැඩි ලෝභය හා මානසික දුක දුරුකරමින්, ධර්මයන් කෙරෙහි ධර්මයන් ගේ යථාස්වභාවය අනුව බලමින් වාසය කරයි *(ධම්මානුපස්සනාව)*. මේ අයුරින් ධර්මයන් කෙරෙහි ධර්මයන් ගේ යථා ස්වභාවය අනුව බලමින් වාසය කරන ඔහු ගේ සිත කිසිවකට නො ඇලේ. ලෝකයේ කිසිවක් අල්ලා නො ගෙන සිත කෙළෙසුන් ගෙන් මිදෙයි.

පින්වත් සාරිපුත්ත, විමුක්ත සිතකින් යුතු වන්නේ ඒ අයුරිනු යි.

පින්වත් සාරිපුත්ත, විමුක්ත *(අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් නිදහස් වී ගිය)* සිතකින් යුතු තැනැත්තා මම මහා පුරුෂයෙක් ලෙස කියමි. විමුක්ත නො වූ සිතක් ඇති තැනැත්තා මම මහා පුරුෂයෙක් ලෙස නො කියමි.

භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මේ උතුම් දේශනය වදාළා. සාරිපුත්ත මහරහතන් වහන්සේ ඉතා සතුටට පත් වුනා. භාග්‍යවතුන් වහන්සේ වදාළ මේ උතුම් දේශනය සාධුකාර නංවමින් සතුටින් පිළි ගත්තා.

**සාදු ! සාදු !! සාදු !!!**



**DhammaMedicine**

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

Visit this Google Group
Click2Comment | Discussions |



**Drink Dhamma medicine to get rid of all stresses**